(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 48.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 පෙබරවාරි මස 09 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** පරිසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

ගරු සිවශක්ති ආනන්දන් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා

ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ගාර්දිහේවා සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම :** පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගාර්දිහේවා සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා මහතා 99 (අ) ව්‍යවස්ථාව යටතේ නීති ප්‍රකාර ප්‍රතිඥා දී පොතෙහි අත්සන් කළේය.

**2. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කරන ලද **"පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)"** නැමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි 4 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව සමඟ අනනුකූල වන බැවින් අධිකරණය විසින් යෝජනා කර ඇති පරිදි එම වගන්තිය සංශෝධන කිරීමෙන් අනනුකූලතාවය ඉවත් කළ හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

තවදුරටත්, පනත් කෙටුම්පතෙහි අනෙකුත් විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ අනනුකූල නොවන බවද එහි සිංහල හා ඉංග්‍රීසි පිටපත්වල 2 වැනි වගන්තියේ ඇති වී තිබෙන අනනුකූලතාවය කාරක සභා අවස්ථාවේදී නිවැරදි කළ හැකි බවද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි මම නියෝග කරමි."

**II**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව **"බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන)"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන

ලද පෙත්සම් දෙකක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 50 (2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය විසින්, 2014 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) දියතලාව, හෙලවත්ත, අංක 297 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. ටී. අයි. කොඩිතුවක්කු මහතාගෙන් ලැබුණු 2015.12.05 දිනැති පෙත්සම ගරු හරින් ප්‍රනාන්දු මහතා විසින් පිළිගන්වන ලදී.

(2) ගොකරැල්ල, වාගොල්ලවත්ත, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි එම්. ජී. එම්. මිල්ලවාන මහතාගෙන් ලැබුණු 2015.10.26 දිනැති පෙත්සම ගරු අශෝක් අබේසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) අකුරැස්ස, පෝරඹ, දෙනියාය පාර, අංක 216/1 දරන ස්ථානයෙහි පදිංචි එම්. ජී. ඩේවිඩ් අප්පුහාමි මහතාගෙන් ලැබුණු 2015.10.04 දිනැති පෙත්සම; සහ

(ii) වැලිගම, පැලැන, "ගංගාසෙවන" යන ලිපිනයෙහි පදිංචි පී. එච්. ගුණපාල මහතාගෙන් ලැබුණු 2015.09.28 දිනැති පෙත්සම

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) ඇහැළියගොඩ, කෙළින් වීදිය, අංක 277/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. ටී. ඒ. මන්සූර් මහතාගෙන් ලැබුණු 2015.10.03 දිනැති පෙත්සම; සහ

(ii) දෙහිඕවිට, අල්ගොඩ, "දැහැමි සෙවන", අංක A 58 - 2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජයන්ත වීරසිරි මහතාගෙන් ලැබුණු 2015.11.18 දිනැති පෙත්සම

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) වාද්දුව, පොහොද්දරමුල්ල, ගාලු පාර යන ලිපිනයෙහි පදිංචි ඒ. එස්. කමල් පෙරේරා මහතාගෙන් ලැබුණු 2015.11.02 දිනැති පෙත්සම;

(ii) කළුතර දකුණ, අරලිය උයන, ජය මාවත, අංක 41, "තරංගා" යන ලිපිනයෙහි පදිංචි ජේ. එස්. ඩබ්ලිව්. සිල්වා මහත්මියගෙන් ලැබුණු 2015.11.27 දිනැති පෙත්සම; සහ

(iii) කළුතර උතුර, පන්සල පාර, අංක 34, දරන ස්ථානයෙහි පිහිටි වීරවර්ධනාරාමයේ වැඩවසන පූජ්‍ය පාතකඩ විමලඥාණ හිමිගෙන් ලැබුණු 2015.11.04 දිනැති පෙත්සම

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(6) හැටන් (හරහා), මොරහේනේගම, කිරිවැල්හීන්න ගම, අංක 95/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එම්. ගාමිණී ලක්ෂ්මන් මහතාගෙන් ලැබුණු 2015.10.20 දිනැති පෙත්සම ගරු කේ. කේ. පියදාස මහතා විසින් පිළිගන්වන ලදී.

(7) නාවලපිටිය, බේලිපාර, අංක 54 දරන ස්ථානයෙහි පදිංචි එස්. එල්. පාතිමා රියානා මහත්මියගෙන් ලැබුණු 2015.12.28 දිනැති පෙත්සම ගරු ආනන්ද අලුත්ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) පොළොන්නරුව, තල්පොත, බී. ඕ. පී. 317, අංක 13 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. හේමකුමාර මහතාගෙන් ලැබුණු 2015.09.15 දිනැති පෙත්සම ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා විසින් පිළිගන්වන ලදී.

(9) ගල්කිස්ස, ගාලු පාර, අංක 259/3 දරන ස්ථානයෙහි පදිංචි ඒ. කේ. සයිරික් මහතාගෙන් ලැබුණු 2015.10.15 දිනැති පෙත්සම ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

4 වැනි වගන්තිය

(1) අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 3 වැනි පිටුවේ 28 වන සහ 31 වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

**තෝරා පත්කරනු ලැබිය යුතු කාන්තා සභිකයන් ප්‍රකාශයට පත් කිරීම**

"28 (2අ) වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි එකී පළාත් පාලන ආයතන ප්‍රදේශවල සියලු කොට්ඨාසවලින් තෝරා පත්කරනු ලැබිය යුතු කාන්තා සභික සංඛ්‍යාව ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් අතර බෙදා වෙන් කිරීමේ දී මැතිවරණ කොමසාරිස්වරයා විසින්, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් එකී පළාත් පාලන ආයතන ප්‍රදේශය තුළ වූ සියලු කොට්ඨාසවලින් ලබාගත් වලංගු ඡන්ද සංඛ්‍යාව සැළකිල්ලට ගනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවේ දක්වා ඇති බෙදා වෙන් කිරීමේ ක්‍රමය ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගත යුතු ය:

එසේ වුව ද, 28 වන වගන්තිය යටතේ ඒ වන විටත් නම් කරනු ලැබ ඇති තැනැත්තන්ට අමතර වූ තැනැත්තන් සංඛ්‍යාවක් නම් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් යම් පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්ට හෝ යම් ස්වාධීන කණ්ඩායමක නායකයාට නියම නොකරනු ලැබිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි එකී ලේකම් හෝ කණ්ඩායමේ නායකයා හෝ විසින් නාම යෝජනා කරමින් කිසිදු ලැයිස්තුවක් ඉදිරිපත් කිරීම නොකරනු ලැබිය යුතු ය."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 4 වැනි පිටුවේ 10 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා වූ සියලු පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"5. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය එකී වගන්තියේ (1) වන උපවගන්තියේ "65අ වගන්තිය යටතේ" යන වචන වෙනුවට "65අ වන සහ 65අඅ වන වගන්ති යටතේ" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය

(1) අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 4 වැනි පිටුවේ 21 වන පේළියේ සිට 24 වන පේළිය දක්වා වූ සියලු පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" (අ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ -

(1) "මෙම ආඥාපනතේ 65අ වන වගන්තිය යටතේ තෝරා ගනු ලැබූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ ආඥාපනතේ 65අ වන සහ 65අඅ වන වගන්ති යටතේ තෝරා ගනු ලැබූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) "ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය." යන වචන වෙනුවට ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;"

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 1 වන පේළියේ සිට 4 වන පේළිය දක්වා වූ සියලු පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ඊළඟට නම තිබෙන කාන්තා අපේක්ෂිකාව, පුරප්පාඩුව ඇති වී දින තිහක් ඇතුළත තෝරාගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කළ යුතු ය."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 29 වන පේළිය සහ 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"සම්බන්ධයෙන් වනවිට, 28 වන වගන්තියේ (2අ) වන උපවගන්තිය ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි අදාළ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් භාර දෙනු ලැබූ අනෙක් නාම යෝජනා පත්‍රයේ ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව."

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**දීර්ඝ නාමය**

"දීර්ඝ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුය"යි යන ප්‍රශ්න විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**6. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; අ. භා. 3.05 ට 2016 පෙබරවාරි මස 10 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.